# අපූරු මායාලන්තයේ චාරිකාව





නෙතුලි තිලකරත්න

# අපූරු මායාලන්තයේ චාරිකාව

කතෘ :- නෙතුලි හිමංසා තිලකරත්න

කෘතිය පල කරන දිනය :- 2023/ 11 / 15

කතෘගේ වෙනත් කෘති :-

කූඹි රැජින

මලීගේ උපකාරය

දඟකාර මීකී

කපුටු බඩගින්න

පාට මොකද්ද

The Queen Ant

# පිදුම

මගේම

ආ අප්පච්චිටත්,
ද අම්මාටත්,
ර මල්ලීටත්,
ණී සමන්මලී
ය ගුරුමෑණියන්ටත්
පුද දෙමි
මෙම පොත
සදාදර සිතින් !

# ස්තූතිය!

උදව්

උපකාර

කළ

සැමට

මාගේ

හදපිරි

**ස්තූතිය !**

නෙතුලි හිමංසා තිලකරත්න

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණ කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “ **දිවිය දිනන විද්‍යුත් පොතක්** ” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “ **දිවිය දිනන විද්‍යුත් පොතක්** ” ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප  පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

# අපූරු මායාලන්තයේ චාරිකාව


ඕනා කියන්නේ පුංචි ළමයෙක්. දවසක් ඕනා දකිනවා එයාගේ ඇඳ උඩ පොතක් තියෙනවා. එයා ඒ පොත කියවලා රස විඳිනවා.

ඕනා පොත කියවලා ඉවර වෙනකොට ම එයාට ඇහෙනවා "දුව, කෑම කන්න එන්න." ඒ කතා කළේ ඕනාගේ අම්මා. "මේ එනවෝ" ඕනා කිව්වා.




කැම කාලා ඉවර වෙලා පොත බලනකොට. ඒ පොතේ හිටපු ක්ලාරා, එන්ස්, තීනෝ, චාලි මේ කවුරුත් ම පොතේ හිටියේ නෑ. ඕනා පුදුම වෙලා බලාගෙන හිටියා.

එතකොට ම ඕනා ට දිලිසෙන යමක් පෙනුණා. එයා බයෙන් බයෙන් එතනට ගියා. ඒ දිලිසුනේ අම්මා ඇඳපු චිත්‍රයක්. ඕනා ඒ දෙසෙ පුදුමයෙන් බලා හිටියා.




ඕනාගේ ඉල්ලා ප්‍රින්ට් ඒ චිත්‍රයට පැන්නා. ඕනාත් චිත්‍රයට පැන්නා. අම්මායි, තාත්තායි එයාලව හෙව්වා. එතකොටත්, එයාලා අමුතු මාර්ගයකින් ගමන් කරමිනුයි හිටියේ. ඕනා දැන්නා කතා කරන සමනලයෙක්. ඕනා ගෙදර යන්න පාර ඇසුවා.




“ මම දන්නේ නෑ. හැබැයි මට ඔයාව වෙන තැනකට නම් එක්කන් යන්න පුළුවන්. ඔයා කැමති ද ?’’ කියලා සමනලයා ඇසුවා.

“ඔව්. මම යන්න කැමතියි. ප්‍රීංටි බය වෙන්න එපා” ඕනා කිව්වා.



“හැබැයි. ඔයා ඔයාගේ බලු පැටියත් එක්ක අර කළු පාට ඇපල් ගෙඩිය තියෙන අත්තට නැගලා බිමට පනින්න” සමනලයා කිව්වා.




“ස්තුතියි ! ඔබට සුභ දවසක් . සතුටින් ඉන්න” ඕනා කිව්වා.

ඕනා ප්‍රීංටි එක්ක ගසෙන් බිමට පැන්නා. එයා තවත් ලස්සන අමුතු ලෝකයකට ගියා.

ඕනා ඒ ලෝකේ ප්‍රීංටි එක්ක තනි වෙලා....

නෑ. එහෙම නෑ. ඕනාගේ නංගා ආනා දුවනවා ඕනා දැක්කා.



එයාලා ආනා පිටුපසින් බයෙන් බයේ ආවා. අනේ! පාර ඉවරයි. ආනා එතන තිබුණු වලකට පැන්නා. ඕනාත් ප්‍රීංටි එක්ක වලට පැන්නා.

අනේ! ඒ පාර ඇඳක් උඩ. ඒ ඇඳේ කුමාරිකාවක් හිටියා.




“මගේ නම ෆෙයානා . ඔයා කවුද ?” ඇය එකවර ම ඕනාගෙන් ඇහුවා.

“මම ඕනා. මේ මගේ බලු පැටියා ප්‍රීංටි.” ඕනා කිව්වා.

“ඔයා මේ කොහේද යන්නේ.” ෆෙයානා කුමරිය ඇහුවා. “මම මගේ ගෙදරට යන්න පාර සොයන්නේ ෆෙයානා” ඕනා කිව්වා



“මේ බලන්න . මේ ඔයාගේ පොත. මේකෙ ක්ලාරා, එන්ස්, නීනෝ, චාලි මේ හැමෝම ඉන්නවා. ඒ වගේ ම මට මැජික් පුළුවන්. මෙහෙ ඉන්න හැමෝට ම  මැජික් පුළුවන්. මෙහෙ තමයි මැජික්ලන්තය. මට පුළුවන් මගේ මැජික් බලයෙන් ඔයාව ගෙදර යවන්න. ඔයා මගේ අත උඩ අත තියන්න.” ෆෙයානා කිව්වා.



ඕනා ප්‍රීංටිව එක අතකින් අල්ලගෙන ඕනාගේ අනිත් අත ෆෙයානාගේ අත උඩින් තිබ්බා. මෙයාලා එක පාරට ම ඕනාගේ ගෙදරට ආවා. ඒ එක්කම ආනාත් ආවා.

හැබැයි සිහිසුන්ව ඇද වැටිලයි තිබුණේ. අම්මා මෙයාලව දැක්කා. අම්මා වතුර ටිකක් ඉස්සා. ඕනාට සිහිය ආවා.ඕනාට එයා ආසම පොත ලැබුණා.

ඕනා එයාලා මුහුණු පා සිද්ධිය අම්මට කිව්වා. ආපසු වැඩිහිටි කාගෙන්හරි අහන්නේ නැතුව කිසිම දෙයක් කරන්නේ නෑ කියලා පොරොන්දු වුණා.

නෙතුලි හිමංසා තිලකරත්න



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු !


මෙයට

**සෙනවිරත්න මහලේකම්**

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ


2023 . 11 . 01